1

Article 10/12(1)

Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 02-01-2017.

පැමිණිලිකාරිය 01. එස්. ඩී. එන්. ප්‍රියංගනී මිය.
අංක 92/22බී, අම්මාන්කෝවිල් මාවත,
මීගමුව පාර, කුරුණෑගල.

- එදිරිව -

වගඋත්තරකරු 01. විදුහල්පති,
මලියදේව පිරිමි විදුහල,
කුරුණෑගල.

පැමිණිලි අංකය : HRC/199/16/L-6

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකාරියගේ දරුවා වන සුරේන්ද්‍රන් දිනෙත් සත්සර 2016 වර්ෂයේ පළමු ශ්‍රේණියට කුරුණෑගල මලියදේව පිරිමි විද්‍යාලය ඇතුලත් කර නොගැනීම සම්බන්ධයෙන් මෙම පැමිණිල්ල ගොනු කර තිබේ.

පැමිණිලිකාරියගේ කරුණු දැක්වීම

පැමිණිලිකාරිය උක්ත ලිපිනය යටතේ CO-250 අංකය යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ඇති අතර, එහිදී මුළු ලකුණු 89ක් හිමි වී ඇත. නමුත් තමාගේ සැමියා හින්දු ආගමිකයකු හෙයින්, තමාගේ දරුවා වන දිනෙත් සත්යරද හින්දු ආගමිකයකු ලෙස සලකා අන්‍යාගමික ගණයට යොමු කල හෙයින් එම නිසා දරුවාව පාසලට ඇතුලත් කර ගැනීමේ අවස්ථාව අහිමිවී ඇති බව ප්‍රකාශ කරයි.

තවද විදුහල වෙත අභියාචනයක් ඉදිරිපත් කරමින් ගමේ විහාරස්ථානයේ දායක සභාවේ දායකයන් බවට විහාරස්ථානයේ විහාරාධිපති හිමියන්ගේ ලිපියක්ද ඉදිරිපත් කල අතර අභියාචනා මණ්ඩලය විසින් එය සලකා නැති බවද දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා බෞද්ධාගමිකයෙකු වුවද එකී පදනම යටතේ පාසලට ඇතුලත් කර නොගැනීම මත මූලික

ධාන කාර්යාලය / ரதான அலுவலகம் / ead Office } 165,කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman } 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@sltnet.lk
රකථන / தாலைபேசி / elephone } 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் } 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 011-2689558, 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

අයිතිවාසිකම් කඩවීමක් සිදු වී ඇති බැවින් ඒ සම්බන්ධව සහනයක් ලෙස තම දරුවාව පාසලට ඇතුලත් කර දෙන ලෙස මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිටී.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම

නියෝජ්‍ය විදුහල්පති පී. වී. එස්. කේ. ඒ. පොත්තැවිල මහතා ප්‍රකාශ කර සිටියේ උක්ත පැමිණිලිකාරිය ඉහත පාසලට සිසුන් ඇතුලත් කරගැනීම සඳහා පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිට ඇති අතර, එහිදී

| | | |
|---|---|---|
| ජන්ද හිමි නාමලේඛනය සඳහා | - | 35/35 |
| පදිංචිය තහවුරු කරන ලේඛනය සඳහා | - | 4/10 |
| පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන සඳහා | - | 5/5 |
| පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය සඳහා | - | 45/50 |

වශයෙන් මුළු ලකුණු 89 ක් ලබා ගෙන ඇත.

නමුත් මව . හා පියා ආගම් දෙකක වන අවස්ථාවන්හිදී පියාගේ ආගම දරුවාගේ ආගම ලෙස සලකන අතර, මීට පෙර වර්ෂවලදී මෙවැනි ගැටළු මතුවූ අවස්ථාවලදී ඒ ආකාරයෙන්ම සලකා ඇති බැවින්, ඒ අනුව මෙම දිනෙත් සත්සර දරුවා හින්දු ආගමික දරුවෙකු ලෙස සලකන ලද බවත්ය. ඒ අනුව අන්‍ය ආගමික පදනම යටතේ දරුවන් ඇතුලත් කරගෙන ඇති ලකුණු ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් පැමිණිලිකාරියට හිමිවී ඇති බැවින් පැමිණිලිකාරියගේ දරුවා පාසලට ඇතුලත් කර ගැනීමට නොහැකි වූ බව ප්‍රකාශ කරයි.

නිගමනය

දෙපාර්ශවයේම කරුණු සලකා බැලීමේදී පෙනී යන්නේ පැමිණිලිකාරිය උපතින්ම බෞද්ධාගමික කාන්තාවක් වන බවත් පැමිණිලිකාරියගේ දරුවා බෞද්ධාගමික පරිසරයක හැදී වැඩෙන බවත්, සම්මුඛ පරීක්ෂණයේදී ලිපි ලේඛන අනුව දරුවා බෞද්ධාගමික දරුවෙකු බව තහවුරු කර තිබුනද වගඋත්තරකරු විසින් එකී කරුණු නොසලකා පැමිණිලිකාරියගේ දරුවා පාසලට ඇතුලත් කර නොගැනීමට තීරණය කර ඇති බවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාව මගින් සෑම තැනැත්තෙකුට කැමති ආගමක් ඇදහීමේ අයිතිය තහවුරු කර ඇත. ඒ අනුව දරුවාගේ පියා හින්දු භක්තිකයෙකු බැවින් දරුවා බෞද්ධාගමිකයෙකු නොවන බවට පාසල විසින් ගත් තීරණය අත්තනෝමතික, අසාධාරණ සහ තාර්කික පදනමක් නොමැති තීරණයකි. එකී තීරණය ගැනීමේදී වගඋත්තරකරු [illegible]

එකී තීරණය මගින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාව සහ 12(1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව තීරණය කරමු

ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා වන සුරේන්ද්‍රන් දිනෙත් සත්සර දරුවා 2017 වර්ෂයේ දෙවන ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සඳහා වගඋත්තරකරු වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ. මෙම නිර්දේශයේ පිටපතක් ජාතික පාසල් අධ්‍යක්ෂක හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ටද යැවීමට තීරණය කරමු.

2017.01. 31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධව වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම එකී නිරදේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 165, Kynsey Road,
Colombo 08.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 165, Kynsey Road,
Colombo 08.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත : ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.
අවශ්‍ය පියවර සඳහා

රේ/-

*Room No : 03*